# අයිවන්ගේ මාළුවා අසුවන තෙක් බලා සිටිමි

උවිඳු කුරුකුලසූරිය
uvinduk@lamkindependent.com

> ලංකාවේ යුක්තිය සාධාරණය කොයිබටද? ඉදින් මා වික්ටර් අයිවන්ගෙන් ඉල්ලා සිටින්නේ එදා මෙන්ම රාවයේ අනෙක් අය සමඟ මාළු බාන්නට එක් වන ලෙසය. ඔබ මාළු නොබෑම ලංකාවට ලොකු අඩුපාඩුවකි. ලංකාවේ මාධ්‍ය නිදහස වෙනුවෙන් වැඩිම සම්මාන ලැබූ මාධ්‍යවේදියා ඔහුය. ඔහු කියන පරිදි මහින්ද බලයට ආ දින සිට ඔහු දේශපාලන ක්‍රමය වෙනස් කළ හැක්කේ කෙසේද යන්නට පිළිතුරු සොයමින් සිටී.

රාවය කර්තෘ වික්ටර් අයිවන් පසුගිය 31 වනදා රාවයට ලියූ 'අධිකරණය, ජනමාධ්‍ය හා සමාජ දේශපාලන යථාර්ථය' නම් ලිපිය සන්ඩේ ලීඩර් පුවත්පතේ පළවූ මාගේ ලිපියකට ප්‍රතිචාරයක් බව එහි සඳහන්ව තිබුණි. එම ලිපිය ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් යුක්තය. ඒ පළමුව මා පිළිබඳ විවේචනයද දෙවනුව අධිකරණ නිදහස පිළිබඳව 'ඔහුගේ' අරගලය පිළිබඳව දීර්ඝ ඉතිහාස කතාවද තුන්වෙනුව ජනමාධ්‍යයේ කාර්යභාරයද වශයෙනි.

මර්දනීය ආණ්ඩුවකට එරෙහිව පිටුවහලේ සිට ලිවීම හා තම රටේ සිට ලිවීම සමාන වන්නේ නැති බවත් උවිඳු මෙවැනි විවේචනාත්මක ලිපියක් ලියන්නේ පිටුවහලේ සිට බව සිය ලිපියේ සඳහන් කළ යුතුව තිබුණු බවත් වික්ටර් ආචාරධාර්මික ප්‍රශ්නයක් මතුකරයි. එය ඉතාම වැදගත් ප්‍රශ්නයකි. මේ ලිපිය පමණක් නොව රටට ගැලපෙන ලෙස සංස්කරණය කරමින් සන්ඩේ ලීඩර් පුවත්පත නැවත පළකරන ලද ලිපි සියල්ලම මා ලියන ලද්දේ ලසන්ත වික්‍රමතුංගගේ බිරිඳ සහ මෝනිං ලීඩර් පුවත්පතේ කර්තෘ සොනාලි සමරසිංහ සහ මා විසින් පවත්වාගෙන යනු ලබන www.lankaindependent.com නමැති වෙබ් අඩවියටය. එබැවින් මා පිටුවහලේ සිට ලියන ලද බව සඳහන් කළ යුතුව තිබුණේ සන්ඩේ ලීඩර් පුවත්පතින් මිස මවිසින් නොවේ.

දෙවන කොටසේදී ඔහු මෙසේ කියයි. එනම් 'අධිකරණයේ ගෞරවය සහ ස්වාධීනත්වය වෙනුවෙන් මා කිසියම් අරගලයක නිරත වී නම් එය ඉඳහිට පුවත්පතකට ලියන විවේචනයකට සීමා වූ දෙයක් නොවන බවය'. එය දශකයක ආසන්න කාලයක් තිස්සේ දිගින් දිගටම ලීවෙමි. කතුවැකි වශයෙන් හෝ ලිපි වශයෙන් ලියන ලද වාර ගණන සියයකට වැඩිය. එය පමණක් ප්‍රමාණවත් නොවන බව තේරුම්ගත් විට උසාවි ක්‍රියාමාර්ගයකට යොමුවුණෙමි.' මේ ආදීවශයෙන් වික්ටර් අයිවන් ඉතිහාසය ලියාගෙන යයි. මෙය කියවූ විට මේ 'මම' යනුවෙන් වික්ටර් සඳහන් කරන්නේ ඔහු ගැනද නැත්නම් ඔහුද ඇතුළුව එකල රාවයේ සිට මේ අරගලයේදී ප්‍රමුඛ කාර්යයක් කළ සියලු දෙනා පිළිබඳවද යන්න මා තුළ මතුවිය. වික්ටර් 'මම' යනුවෙන් සඳහන් කරන්නේ ඔහු පිළිබඳවය. රාවයෙන් කළ මේ අරගලයේ සිටි අනික් අයද හැඳින්වීම සඳහා 'මම' යන්න භාවිත කරන්නේ නම් මා පිළිබඳ හැල්ලුවෙන් සඳහන් නොකළ යුතුව තිබුණි.

'සිංහයා ඉතිහාසය ලියුවොත් දඩයම හොඳම දේ ලෙස එහි සඳහන් කරනු ඇත.' යනුවෙන් දකුණු අප්‍රිකානු කියමනක් තිබේ. එහි අර්ථය නම් තමා කළ දේ පමණක් විශිෂ්ට කොට සැලකීමය. රුවන්වැලි සෑය සාදන ලද්දේ දුටුගැමුණු රජු ලෙස ඉතිහාසයේ සඳහන්ය.

එහෙත් එහි ගෘහනිර්මාණ ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන්, වැඩ පරීක්ෂකවරුන්, රන්කරුවන් හා ඒ සඳහා දුටුගැමුණුට ගල් කැඩූ අය ගැන කොහේවත් සඳහනක් නැත. ජනමාධ්‍ය ඉතිහාසයේ පළවූ දළ කෙටුම්පත යැයි කියනු ලැබේ. එනම් නිරවද්‍යතාව පිළිබඳව අනාගත ඉතිහාසඥයන් පිහිට පතන එම දළ කෙටුම්පත කෙරෙහි දක්වන සැලකිල්ලය. අර්ථය අහෝසි වී යන තරමට හෝ විකෘතියක් ඇතිවන තරමට හෝ සන්දර්භයෙන් වියෝ කර ඇති බවක් මිනිසුන්ට පෙනී යන වාරයක් පාසා මාධ්‍යයට ඇති පිළිගැනීම වැඩි වැඩියෙන් පහව යයි. එනිසා වික්ටර් කියනු ලබන ඉතිහාසයේ යම් යම් කරුණු නිවැරදි කළ යුතුය.

තමා මේ අරගලයේ දී ලිපි සියයකට වඩා ලිවූ බව ඔහු සඳහන් කරයි. නමුත් දෝෂයන්ගෙන් ගහණ ඔහුගේ 'නොනිමි අරගලය' කෘතිය අනුව මහේස්ත්‍රාත් ලෙනින් රත්නායකගේ ප්‍රථම ස්ත්‍රී දූෂණය වාර්තා කළ 1997 අගෝස්තු 17 වැනිදා සිට අගවිනිසුරුවරයාට එරෙහිව පාර්ලිමේන්තුවට දෝෂාභියෝගයක් ඉදිරිපත් වූ 2001 ජූනි 06 වැනිදා තෙක් මේ සිද්ධි දාමයට සම්බන්ධ 'රාවයේ' පළවූ මුල් පුවත් සංඛ්‍යාව 21කි. කතුවැකි සංඛ්‍යාව 14කි. සාමාන්‍ය වාර්තා ගණන 79 කි. විශ්ලේෂණාත්මක හා සම්මුඛ සාකච්ඡා ගනයේ ලා සැලකිය හැකි ලිපි සංඛ්‍යාව 58 කි. ඔහු විසින් මේ විෂයෙහි ලා ජනරංජනගේ විශිෂ්ට කාටූන් ගණන් කර නොමැත. දැන් මේ සියලු දේ වික්ටර් අයිවන් ලියූ දේද? ඔහු විසින් සොයාගත් දේද? නැත. එහෙත් ඔහු වැනි උදාර පුද්ගලයෙකු එනම් එකවරම කතුවරයකු හා පුවත්පත් අයිතිකරුවකු නොසිටින්නට මේ අරගලය මේ ආකාරයෙන් නොවනු ඇත.

මේ අරගලය එනම් අධිකරණ පද්ධතියේ කඩාවැටීම පිළිබඳ නිර්භීතව ලියන සම්ප්‍රදාය රාවය ඇරඹුයේ ලෙනින් රත්නායක සිද්ධියට බොහෝ කලකට පෙරය. එහෙත් වික්ටර් අයිවන් ප්‍රශ්නය තේරුම් ගැනීම යන අනුඡේදය යටතේ කියන්නේ 'අධිකරණය බරපතල ලෙස ප්‍රශ්නකරන දිග්ගැසුණු ක්‍රියාදාමයකට මා තල්ලු වුණේ අහඹු සිද්ධියකිනි. මහේස්ත්‍රාත්වරයකු අතින් සිදුවී තිබුණ සනාථ කළ නොහැකි නොහොබිනා වරදක් මා වාර්තා කළේ සිදුවී තිබුණු එම වරද ඒ මගින් නිවැරදි කරවාගත හැකිය යන විශ්වාසයකිනි' යනුවෙනි. එය එසේ යැයි සිතුවද එම සිද්ධිය රාවයට රැගෙන ආවේ මා විසිනි. මගේ පාසල් මිතුරකු හරහාය. ඔහු මොහාන් විජේරත්නය. මේ සිද්ධිය නිසාම ඔහු කලක් රාවයේ ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස කටයුතු කිරීමට පෙළඹුණේය.

ඊට වසරකට පසු ලංකාවේ පැවති ප්‍රථම කර්තෘ සංසද සම්මාන උළෙලේදී මේ සිද්ධිය සම්බන්ධයෙන් ගවේෂණාත්මක වාර්තාකරණය සඳහා විශිෂ්ට සම්මාන හිමිවූයේ මොහාන් විජේරත්න, ආනන්ද ජයසේකර, නිව්ටන් සෙනවිරත්න හා උවිඳු කුරුකුලසූරිය යන අයවලුන්ටය. එය වික්ටර් අයිවන්ටත් ලැබිය යුතුව තිබුණි. එහෙත් එකල ඔහුගේ තිබූ නිරහංකාරත්වය නිසාම ඔහු විසින්ම සකසන ලද සම්මාන අයදුම්පතට නම් ඇතුළත් කර තිබුණේ අපගේ පමණි. මා ඉඳහිට මේ විෂය පිළිබඳව ලිපි ලියන්නකු ලෙස පසුගිය සතියේ හඳුන්වා තිබුණද රාවය කර්තෘ මාණ්ඩලිකයෙකු ලෙස වැඩිම වාරයක් ඔහුගේ 'නොනිමි අරගලය' තුළ නම් සඳහන් වන්නේද ප්‍රශංසාවක් හෝ කර ඇත්තේද මා පිළිබඳවය. අඩුපාඩු සහිත වුවත් වික්ටර් ඔහුගේ කෘතියේ ඒ දෙය ඉටු කර තිබෙන බැවින් දීර්ඝ ලෙස ඒ පිළිබඳව කීමට අදහස් නොකරමි.

එහෙත් ඔහුගේ පසුගිය ලිපියේ කරුණු කිහිපයක් නිවැරදි කළ යුතුව තිබේ. 'සටනකට යන්නට පෙර ඔහු නීතිපති පිළිබඳව සොයාබලන තැනකට ගිය බවත් එහිදී හොයාගත් කරුණු ඒ මොහොතේ ඔහුගේ විස්මයට හේතුවූ බවත් කියයි. ඒ නීතිපතිගේ අනාචාර ජීවිතය හා ඒ පිළිබඳවූ නඩුව මත අභියාචනා අධිකරණ විනිසුරුවකුව සිටියදී කළ බලපෑමය. නමුත් කරුණු වශයෙන් මෙය සාවද්‍යය. සරත් සිල්වා පිළිබඳ සියලු තොරතුරු අඩංගු ලිපිගොනුව කාරයකින් රාවයට පැමිණි කාන්තාවක විසින් වික්ටර් අයිවන්ට බාරදෙන ලද්දේ සරත් සිල්වා නීතිපති ධුරයට පත් කරන්නට සැලසුම් කර තිබියදීය. එම මෝටර් රථයේ අංකය සටහන් කරගත් වික්ටර් අයිවන්ට අනුව එම කාන්තාව රාවයට එවා තිබුණේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු අධිකරණ හා ව්‍යවස්ථාදායක ඇමති චොක්සි විසින්ය. එහෙත් එකල වික්ටර් අයිවන් තමා බලයට පත් කිරීමට මහන්සිවූ පොදු පෙරමුණ සමඟ පිටතට පෙනෙන අරගලයක නිරත වී නොසිටියේය. ඒම අවස්ථාවේ සරත් සිල්වා පිළිබඳව නොලියුවේය. සමහරවිට පසුව වන්දි ගෙවන්නට සිදුවූයේ එයටම වන්නටද බැරිය.

ඔහුගේ ලිපියේ තවත් ප්‍රධාන දෝෂයක් නම් අගවිනිසුරුවරයා ආරක්ෂා කරගැනීම සඳහා ඔහුට එරෙහිව දෝෂාභියෝගය එල්ලවූ අවස්ථාවේදී ජනාධිපතිනිය පාර්ලිමේන්තුව විසුරුවා හැර අගවිනිසුරුවරයා ආරක්ෂා කරගත් බව කීමය. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා අගවිනිසුරුවරයා පිළිබඳව පාර්ලිමේන්තුවේ විශාල සාකච්ඡාවක් ඇතිවීමත් ඒවා ජනමාධ්‍යයේ වාර්තාවීමත් සැලකුණු බව නම් සත්‍යයකි. එහෙත් මේ දෝෂාභියෝගයට අත්සන් තබා තිබුණේ මන්ත්‍රීවරුන් 77 කි. (එජාප හා ජවිපෙ). ඒද ජයගැනීමේ අරමුණින් නොව ඒ පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ අරමුණිනි. වික්ටර්ගේ තර්කයට සාධාරණයක් ඉටු කිරීම සඳහා දෝෂාභියෝගය ජයගතහැකි වී තිබුණේ යැයි මොහොතකට සිතමු. එහෙත් පාර්ලිමේන්තුව විසිරුවා හැරියා නොව සිදුවුණේ පාර්ලිමේන්තුව සැසිවාරය කල් තැබීමය. සිදුවූ සිද්ධිදාමය මෙසේය. අගවිනිසුරුට එරෙහි දෝෂාභියෝගය භාරදුන්නේ 2001 ජූනි 6 දිනය. ඇත්ත වශයෙන්ම එය භාරදීමට තිබුණේ ජූනි 7 දිනය. එහෙත් සරත් සිල්වා විසින් දියත් කර තිබූ නීතිමය කුමන්ත්‍රණය හේතුකොටගෙන එය රහසිගතව කථානායකවරයා වෙත බාරදෙන ලද්දේ ජූනි 6 වන දිනය. ජූනි 7 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම දෝෂාභියෝගය පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළ නොහැකි වන පරිදි වාරණ නියෝගයක් ලබා දුන්නේය. එමගින් රට තුළ ව්‍යවස්ථා අර්බුදයක් ඇති කළද ජූනි 29 දින කථානායකවරයා ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ඉවත දමමින් දෝෂාභියෝග යෝජනාව පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළේය. ඉන්පසු සිදුවූයේ මුස්ලිම් කොංග්‍රස් නායකයා වූ රාවුෆ් හකීම් ජනාධිපතිනිය වෙත ඇතිකරගත් මතභේදය හේතුවෙන් ඔහුගේ අමාත්‍යධුරය අහිමි කිරීම හේතු කොට ගෙන මුස්ලිම් කොංග්‍රස් මන්ත්‍රීවරුන් 7ක් සමඟ විරුද්ධ පක්ෂයේ වාඩිවීමය. ආණ්ඩුවේ බහුතරය ඒ නිසා බිඳවැටීම හේතුකොට ගෙන එක්සත් ජාතික පක්ෂය ජූලි 8 වැනිදා විශ්වාසභංග යෝජනාවක් කථානායකවරයා වෙත බාරදුන් අතර එය විවාද කිරීම සඳහා ජූලි 16,17,18 සහ 19 යන දිනයන් යොදා ගත්තේය. ජනාධිපතිනිය ජූලි 10 වන දින පාර්ලිමේන්තු සැසිවාරය සැප්තැම්බර් 7 දා දක්වා කල් දමමින් අගවිනිසුරුට එරෙහිව දෝෂාභියෝගයට අත්සන් කළ ජනතා විමුක්ති පෙරමුණේද සහය ඇතිව පරිවාස ආණ්ඩුවක් සැප්තැම්බර් 7 දා පිහිටුවීය. වැදගත් කරුණක් නම් රවුෆ් හකීම් ප්‍රසිද්ධියේම අගවිනිසුරු වෙනුවෙන් පෙනී සිටි පුද්ගලයෙක් වීමය. නැවතත් 28 වනදා එජාපය ආණ්ඩුවට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් බාරදුන් අතර ඔක්තෝබර් 9 වනදා හා 10 වනදා එස් බී දිසානායක ඇතුළු 9 දෙනෙකු විපක්ෂයේ අසුන් ගැනීම නිසා සැප්තැම්බර් මස 10වනදා ජනාධිපතිනිය විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. මේ සිද්ධිදාමය සරත් සිල්වා ආරක්ෂා කර ගැනීමටයැයි කීමට කිසිදු හේතුවක් නැත. මේවා මාස කීපයකදී සිදුවූ වෙන වෙනම සිද්ධීන්ය.

වික්ටර්, සරත් ෆොන්සේකා කරළියට නොඑන්නට උවිඳු කුරුකුලසූරියගේද විරුද්ධ පක්ෂයේද පොදු අපේක්ෂකයා වන්නට තිබුණේ සරත් සිල්වා බව කියයි. සමාවන්න! සරත් සිල්වා නැමති අශීලාචාර මිනිසා සමඟ මා ගැටලුවක් ඇතිකරගනු ලැබුවේ ලෙනින් රත්නායක සිද්ධියට බොහෝ කලින්ය. ඒ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රියෙන්සි අර්සකුලරත්න සිය මස්සිනාගේ දූෂණ අඩංගු ලිපි ගොනුව තමා සන්තකයට ගනිමින් මස්සිනාට රට හැර යන්නට ඉඩසැලසූ පුවත වාර්තා කිරීමෙන් පසුව නීතිපති සරත් සිල්වා සිය සගයා රැක ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවේදීය. මගේ ප්‍රශ්නකිරීම් හමුවේ නිරුත්තරවූ ඔහු 'කකුල පහතට දාගෙන කථාකරනවා යැයි' මට තර්ජනය කළේය. පෙරළා උත්තර දුන් මා එවිට කියා සිටියේ මේක උසාවිය නොවන බවත් මාගේ ප්‍රශ්නවලට උත්තර දෙන ලෙසත්ය. ඔහු පසුව සඳහන් කර තිබූ පරිදි ඔහු එසේ කියා ඇත්තේ මාගේ මානසික ආතතිය බිඳ වැට්ටවීමටය. අධිකරණ ඇමති ජී එල් පීරිස් අපහසුතාවයට පත් කරමින් සෑම සාකච්ඡාවකදීම අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්න කරන ලද්දේ මා විසිනි. ඒවා වික්ටර්ගේ පොතේ අඩංගුය. සරත් සිල්වා විසින් අධිකරණ ඇමතිවරයා නොමග යවන ලෙස දුන් රහස්‍ය වාර්තාව අධිකරණ ඇමතිවරයා නොමග යවමින් ඔහුගේ දිනපොත ඇතුළෙන් ලබාගත්තේද මාය. එය වික්ටර්ගේ නඩුවලට පාදකවූ ප්‍රධාන ලියවිල්ලය. නීතිපතිවරයා හමුවීමට වික්ටර් හා නිව්ටන් සෙනෙවිරත්න සමඟ ඔහුගේ කාර්යාලයට ගොස් ඔහුත් නීතිපතිවරයාත් මස්සිනාලා නොවේදැයි ඇසුවේද මාය. ඒ නෑදෑකම සොයාගත්තේද මාය. ලෙනින් රත්නායක පිළිබඳ සිද්ධිය මුල්වරට රාවයේ පළවූයේ 1997 අගෝස්තු 17 දිනය. සැප්තැම්බර් 17 දින ස්වාධීන රූපවාහිනියේ සජීවී වැඩසටහනක් වූ 'ජනතා අධිකරණය' ට සහභාගිවී නීතිපතිවරයා නිරුත්තර කරන ලද්දේද මාය. 'උවිඳු ඒ කාර්යය හොඳින් කළා' යැයි කියා වික්ටර්ගේ පොත මා හට ප්‍රශංසාවක්ද කර ඇත. 2007 ජූනි 17 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී දූෂණය පිටුදැකීමේ ජාතික සම්මන්ත්‍රණයේදී අගවිනිසුරු සරත් සිල්වාද ඇතුළු අධිකරණයේ දූෂණ එළිදරව් කරමින් විශේෂ දේශනයක් කරන ලද්දේද මා විසිනි. කතාව අවසන් කර පැයක් යන්නට ප්‍රථම වික්ටර් අයිවන් මා අමතා ප්‍රශංසා කළේය. අධිකරණයට අපහාස කළාය කියා මුළු සංවිධායක වරුන්ම අත්අඩංගුවට ගත හැකි බව සරවනමුත්තු. එහෙත් මේ කථාව මා කරන විට ජනාධිපති රාජපක්ෂ හා අගවිනිසුරුවරයා අතර ගැටුමක් නොතිබුණි. ජනාධිපති පත්වී ඒ දක්වා කාලය තුළ වික්ටර් එකම ලිපියක් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ලියා තිබුණේ නැත. නැවතත් ඔහු සරත් සිල්වාට පහර ගැසුවේ සිල්වා හා ජනාධිපති අතර අර්බුදය කරලියට ආ පසුවය. මේවා වික්ටර්ගේ අරගලයේ අඩුපාඩුය. වික්ටර් කියන පරිදි මාළු අසු නොවුණද පිත්ත දියේ දාගෙන ඉන්න හෝ අධිකරණ ස්වාධීනත්වය වෙනුවෙන් ඉඳහිට ලිපි ලියන්නෙක් නොවීමි මම. වික්ටර් කරමින් සිටින්නේ රාවයේ ජනරංජන ඇතුළු අනෙක් අයට පිත්ත දියේ දාගෙන ඉන්නට ඇර තමන් මාළු නොබා ඉඳීමය.

අද ලංකාවේ අධිකරණය පත්වී ඇත්තේ ඉතාම නරක තත්ත්වයටය. 77 ජේ ආර් ගැන කියමින් නිකම් කාලය කා දැමීමේ තේරුමක් නැත.

ලංකාවේ යුක්තිය සාධාරණය කොයිබටද? ඉදින් මා වික්ටර් අයිවන්ගෙන් ඉල්ලා සිටින්නේ එදා මෙන්ම රාවයේ අනෙක් අය සමඟ මාළු බාන්නට එක් වන ලෙසය. ඔබ මාළු නොබෑම ලංකාවට ලොකු අඩුපාඩුවකි. ලංකාවේ මාධ්‍ය නිදහස වෙනුවෙන් වැඩිම සම්මාන ලැබූ මාධ්‍යවේදියා ඔහුය. ඔහු කියන පරිදි මහින්ද බලයට ආ දින සිට ඔහු දේශපාලන ක්‍රමය වෙනස් කළ හැක්කේ කෙසේද යන්නට පිළිතුරු සොයමින් සිටී. දැන් වසර හයක් තිස්සේ සොයන මේ පිළිතුර මේ සතියේදීවත් සොයාගත හැකි වේවා යැයි ප්‍රාර්ථනා කරමි. එසේ නොමැති නම් රාවය කතුවරයා රාවය පාඨකයන් දකිනු ඇත්තේ වසර හයක් තිස්සේ මාළුවා අල්ලා ගත නොහැකිව පිත්ත ගඟේ දාගෙන මාළු බාන බව රටට පෙන්නන්නකු ලෙසය. ■

## අපට විපක්ෂයක්.... 8 පිටුවෙන්

වචනයකට අත් ඔසොවන පිරිසක් පත් කිරීමට ඔහු ක්‍රියා කළේය. පක්ෂයේ අර්බුද අවසන් වන මොහොතේ ජාතික සංවිධායක තනතුරට පත් කිරීමේ දී රනිල් වික්‍රමසිංහ ක්‍රියා කළ නීති විරෝධී දරදඬු ක්‍රමවේදය මේ ප්‍රශ්නය තවදුරටත් උග්‍ර කිරීමට සමත් විය. පක්ෂයේ අන්තර්කාලීන කෘත්‍යාධිකාරී මණ්ඩලයේ යෝජනා ස්ථිර කැරුණු රංජිත් මද්දුම බණ්ඩාර මහතා තුට්ටුවකට ගණන් නොගෙන නායකත්ව සටනේදී සජිත් පාර්ශ්වයට පහර දීමට භාවිත කළ රවි කරුණානායක මහතා බලහත්කාරයෙන් ජාතික සංවිධායක පුටුවේ වාඩිකරවීය. මෙම ප්‍රශ්නය සාමකාමී ලෙස විසඳා ගන්නට රනිල් වික්‍රමසිංහට වුවමනාවක් තිබුණේ නම් සජිත් ප්‍රේමදාස, කරු ජයසූරිය සහ අනෙකුත් නායකයන් සමඟ සාකච්ඡා කොට රවී කරුණානායක මහතාගේ පත්වීම කරන්නට හොඳහැටි ඉඩකඩ තිබූ බව පැහැදිලි කාරණයකි. ඉන් පසුව පක්ෂයේ තීන්දු තීරණ ගැනීමේ දී, මේ තාක් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලැබූ පොදු තීරණ වෙනුවට දැන් තීන්දු තීරණ ගනු ලබන්නේ 6 දෙනකුගෙන් පමණ සමන්විත කමිටුවක් මගිනි. එයට නායකයා, නියෝජ්‍ය නායකයන් දෙපළ, මහ ලේකම්, සභාපති සහ ජාතික සංවිධායක අයත් වේ. පසුගිය මාස කිහිපය තුළ මේ තීන්දු තීරණ ගැනීමේ දී මෙම උපදේශක මණ්ඩලය රැස්වී වාද විවාද කොට එක් මතයකට අවුත් තීන්දු ගත් ඉතිහාසයක් දකින්නට නොතිබූ අතර, රනිල් වික්‍රමසිංහට හිතැ'ති ඔහුට වුවමනා ලෙස තීන්දු තීරණ ගත හැකි, ඔහුගේ තීරණවලට අත ඔසොවන, රවි කරුණානායක, ජයලත් ජයවර්ධන, ශාන්තිනි කෝන්ගහගේ සහ පළාත් සභා විපක්ෂ නායකවරුන් කිහිප දෙනෙක් ද සජිත් ප්‍රේමදාස පාර්ශ්වයට එරෙහිව ක්‍රියා කරන කිහිප දෙනකු ද ඇතුළු කණ්ඩයමක් විසින් මෙම තීන්දු තීරණ ගනු ලබයි. එබැවින් මේ අර්බුදය කිසිවකු විසින් මවාගත් කාරණයක් නොව, කිසිවකුගේ අභියෝගයකින් තොරව 2011 මාර්තු මාසයේ දී නායකයා වූ පසුත් තමන්ට විරුද්ධව නැගී සිටින බලවේගවලට එළව එළවා පහරදීමේ අත්තනෝමතික නායකත්ව ගුණාංගයන්ගේ ප්‍රතිඵලයක් ලෙස පමණක් හැඳින්විය හැක.

දැන් පෙර පුරුදු පරිදිම නැවත අර්බුදය උත්සන්න වී තිබේ. මීට පෙර පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී 35%ක්ව පැවති ඡන්ද ප්‍රතිශතය 20% දක්වා කඩා වැටී තිබේ. සමහර ප්‍රාදේශීය සභා අපේක්ෂකයන් මෙහි දී ඡන්ද කටයුතුවලින් ඈත්වී කටයුතු කරන්නට ක්‍රියා කර තිබේ. ඡන්දපොළට නොගිය ඡන්දදායකයන්ගෙන් විමසූ විට ඔවුන් ප්‍රකාශ කරන කාරණා කිහිපයක් පවතී. 'රනිල් ඉන්නතුරු යූඇන්පී එකට ඡන්දෙ දෙන්නේ නෑ.' 'පක්ෂයට දිනන්න බෑ. ඒ නිසා ඡන්දෙ දීලා වැඩක් නෑ.''කාකොටා ගන්නෙක නතර කරන්න. එතකොට ඡන්දෙ දෙන්නම්'. 'දැන්මම ආණ්ඩුව පෙරළෙන්නෙ නැති නිසා මේකෙදිත් අපි ආණ්ඩුවත් එක්ක ඉඳල ඊළඟ මැතිවරණයේ දි අපි එන්නම්'. වැනි දේ මේ මැතිවරණ ව්‍යාපාරයේ දී එජාපයට ඡන්දය නොදීමට භාවිත කළ තර්ක ලෙස දැක්විය හැක.

දැන් මෙම අර්බුදයේ අලුත් ම කසකරුවා බවට කරු ජයසූරිය මහතා පත්ව තිබේ. අපට සිතෙන හැටියට මෙවරත් මෙම අර්බුදය කාලයක් පැවතීමෙන් පසු ජනතාවගෙන් කොතරම් පිළිකෙවු වුණත්, දිනන්නට නොහැකි වුවත්, තම නායකත්වයේ පුටුවෙන් ඉවත් නොවී නායකත්වය රැක ගැනීමට රනිල් වික්‍රමසිංහ මහතා තම උපරිම බලය යොදවනු ඇත. එහෙත් බහුතරයක් වන අපට විපක්ෂයක් වුවමනාය. රාජපක්ෂ ආණ්ඩුවේ හොරාකෑම්, මර්දනය කිරීම්, තර්ජනය කිරීම්, රාජ්‍ය දේපළ කොල්ලකෑම්වලට එරෙහිව නැගිටින ජනතාව රැවටීමට ඔවුන් පාවිච්චි කරන්නේ දේශප්‍රේමයයි. බැංකි මූන්ගේ වාර්තාවයි. චැනල් 4 නාලිකාවේ විකාශනය වූ කතන්දරයයි. ජාත්‍යන්තර බලපෑම් එල්ලවන්නට එල්ලවන්නට මහින්ද රාජපක්ෂ දේශප්‍රේමයෙන්, ජාති ආලයෙන් සහ යුද්ධය ජයග්‍රහණය කළ වීරත්වයෙන් එයට පිළිතුරු දෙයි. පසුගිය ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් ද ජාත්‍යන්තර බලවේගවලට ඔහු ඡන්ද ප්‍රතිඵලයෙන් පිළිතුරු ලබා දුන්නේය. විපක්ෂයේ නායකයෝ නායකත්ව පුටුවට කුලල් කා ගනිති. මහින්ද රාජපක්ෂට බනින්න තියෙන වේදිකාව රනිල් පතුරු ගැසීමට හෝ සජිත් පතුරු ගැසීමට භාවිතා කැරෙයි. මහින්ද රාජපක්ෂට එරෙහිව ගැටගැසිය යුතු කුමන්ත්‍රණවලට පාවිච්චි කළ යුතු මොළ රනිල් විනාශ කිරීමට හෝ සජිත් විනාශ කිරීමට පාවිච්චි කැරෙයි. ඒ මත ඇති වන ඡන්ද ප්‍රතිඵල සියල්ල මහින්ද රාජපක්ෂට ලැබෙන අතිවිශිෂ්ට ජනමතයක් ලෙස සැලකෙන වන අතර ඔහු විසින් දියත් කරන මර්දනය, ඒකාධිපතිවාදය, ජාතික දේපළ කොල්ලකෑම යන සියලු කාරණා ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට තිබෙන කාරණා බවට පත් ව තිබේ.

එබැවින් එජාපයේ නායකත්ව සටනේ සිටින මහත්වරුනි, අපට කියන්නට ඇත්තේ එක කතාවකි. එක්කෝ වහාම රනිල් වික්‍රමසිංහ එළවා දමා කවුරු හෝ කෙනකු පැමිණ පක්ෂයටත් විපක්ෂයටත් නායකත්වය දී මේ ආණ්ඩුවට එරෙහිව ක්‍රියා කරන්නට ශක්තිය දිය යුතුය. නැතිනම් තවදුරටත් රණ්ඩු කර ගනිමින් එකිනෙකාට මඩ ගසා ගනිමින් මාස ගණනාවකට පසු නැවත නායකත්වය පිළිගත් බවට පුවත්පත් සාකච්ඡා තබමින් යන මේ ගමන නැවැත්විය යුතුය. රටේ පවතින ප්‍රශ්න හොඳින් හඳුනාගෙන ඒවාට එරෙහිව සිංහල දෙමළ පක්ෂ සහ සියලු සංවිධාන එකතු කරගත හැකි සුබදායී ශ්‍රී ලංකාවක් වෙනුවෙන් ජාති, ආගම්, කුල භේදවලින් තොරව නිදහස්ව නිවහල්ව සිතන්නට හැකි නායකත්වයක් ඇති කර ගත යුතුය. කුමන හෝ ක්‍රමයකින් මේ රටේ දුක් විඳින අහිංසක ජනතාව වෙනුවෙන් කල්පනා කර බලා අපට ශක්තිමත් විපක්ෂයක් ලබා දෙන්නට මේ සියලු තරගකරුවන්ගේ දෑස් පෑදේවායැ'යි ද ඔවුන්ට ඥානය ලැබේවායැ'යි ද ප්‍රාර්ථනා කරමු. ■

## ව්‍යුහවාදි දඬුකඳේ.... 23 පිටුවෙන්

ප්ලේටෝගේ සම්භවය වන මෙම සමස්ත බටහිර දර්ශනයම ඩෙරිඩා හැඳින්වූයේ වාග් බ්‍රහ්මත්වයේ යුගය යනුවෙනි.

ඇත්ත. බටහිර දර්ශනය පිළිබඳ හැදෑරීමකින් තොරව ඩෙරීඩා කියවීම දුෂ්කරයි. හැබැයි මෙතනදී ප්‍රංශ දර්ශනය විශේෂයි. රෙනෙ ඩෙකාර්ට්ස්ගෙන් එන කාටිසියානු සංකල්පය තුළ කිසිවක් ඒ හැටියෙන්ම නොගැනීමේ වුවමනාව විසින් කරනා ගවේෂණය ප්‍රංශ දර්ශනවාදයට ආවේණිකය. ඩෙකාට්ස්ගේ උරුමය එඩ්මන්ඩ් හුසර්ල් වෙත ලැබෙන සැටි හුසර්ල්ගේ Cartisian Meditation හැදෑරීමෙන් දත හැකි කරුණකි.

ඉහත ඡේදය මා ලියුවේ ඩෙරිඩියානු ප්‍රවාදය මනෝ විශ්ලේෂණයට සම්බන්ධ වන පාර කපාගැනීමටය. (මනෝවිද්‍යාව සහ මනෝ විශ්ලේෂණය දෙකක් නොව එකක් බව චින්තක ඔළුවෙන් හිටගෙන කියයි. ඔහු එලෙස ඔළුවෙන් හිටගත ලෝකය දුටුවාවේ. එවිටවත් ලෝකය අමුතු ආකාරයකට ඔහුට පෙනෙනු ඇත.) ඩෙරිඩා සංඥාව පිළිබඳ පාරභෞතිකයක පැටලුණු සංඥාර්ථවේදය වෙනුවට ලිවීමේ විද්‍යාව හඳුන්වාදෙන්නේ එමගිනි.

ගයාත්‍රි ස්පිවැක් ඩෙරිඩාගේ of Gramatology වියමන පරිවර්තනය කරමින් ලියන, එකී කෘතියෙන් කාලක් පමණ බර දරා ගත් දීර්ඝ පෙරවදනෙහි සඳහන් කරන්නේ ඩෙරිඩා මනෝ විශ්ලේෂණය විශේෂ වූ හෝ දිශාගත ශික්ෂණයක් ලෙස නොසලකන බවය. ඔහුට අනුව මනෝ විශ්ලේෂණය යනු සද්භාවවාදයේ මූලික සංකල්පීය වචන තේරුම් ගැනීම පහසු කරවන කියවීම් ක්‍රමයකි. ඩෙරිඩාට අනුව මනෝ විශ්ලේෂණය මගින් මනසේ ප්‍රමාණය නැතහොත් සැකැස්ම පිළිබඳ නිවැරදි චිත්‍රයක් සපයා අසාමාන්‍ය පුද්ගලයන්ට ප්‍රතිකාර කරන විද්‍යාවක් නොවේ. එය සැබැවින්ම එයට ආවේණික ශෛලියකින් ඕනෑම වියමනක් කියවා වටහාගත හැකි එක්තරා කියවීමේ ක්‍රමවේදයකි. ■

(මතු සම්බන්ධයි)

## ජාතිය ගොඩනැගීමේ.... 7 පිටුවෙන්

මේ ප්‍රශ්නය ඉස්සරහට යනවා. අවශ්‍ය වන්නේ දෙමළ අය ඉල්ලන දේ දීලා වාර්ගිකත්වය ගොඩනැගීම නෙමෙයි වාර්ගිකත්වය නැති කරන එක.

**රටක ජාතිකත්වය ගොඩනැගීම කියන කාර්යය තුළ ආණ්ඩු පක්ෂයට අමතරව විපක්ෂයටත් විශේෂ කාර්යභාරයක් තියෙනවානෙ. වර්තමාන විපක්ෂය ඒ සම්බන්ධයෙන් තම වගකීම ඉටුකරනවා කියලා ඔබ හිතනවාද?**

නැහැ. පැහැදිලිවම කියනවා නම් ජාතිකත්වය ගොඩනැගීමේ නිවැරදි ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක ආණ්ඩු පක්ෂය විතරක් නෙමෙයි විපක්ෂය දන්නෙත් නෑ. ජනතා විමුක්ති පෙරමුණ වගේ පක්ෂ ගත්තාම ඔවුන් පසුගිය යුද කාලයේ ක්‍රියාත්මක වුණේ අන්ත වාර්ගිකවාදී මනසකින්. අද ඒක වෙනස් වෙලා දේශපාලන සිරකරුවන් සහ අවතැන්වූවන් ගැන කතා කරනවා. එදා ඒ අය යුද්ධයට සහාය නොදුන්න නම් මේ දේවල් වෙන්නෙ නැනෙ. දෙමළ ජනතාවට ගැටලු තියෙනවා ඒවා විසඳන්න ඕනෙ කියලා මීට අවුරුදු කිහිපයකට කලින් ජේවීපීය කිව්ව නම් ඒ අය අවතැන්වෙන්නේ නෑ. ආණ්ඩුවට විසඳන්න බැරි ආණ්ඩුව මඩේ එරුණු ප්‍රශ්නයක් අද උතුරු නැගෙනහිර තියෙන නිසා බොරුවට කෑගහලා වැඩක් නෑ දෙමළ ජනතාවගේ ප්‍රශ්න ගැන. ඒක හරියට කල දුටු කල වළ ඉහගැනීම වගේ වැඩක්.

එක්සත් ජාතික පක්ෂය ඇතුළෙ රනිල් වික්‍රමසිංහ මහතාට තිබුණ ජාතික ප්‍රශ්නය පිළිබඳ මම කියූ සංකල්පවලට ළඟින් යන කිසියම් දෘෂ්ටියක් තිබුණා. නමුත් ඒක මම කිව්ව ආකාරයේ ගැඹුරු එකක් නොවෙන්න පුළුවන්. මේ ප්‍රශ්නය දිහා ප්‍රගතිශීලීව බලපු දෙන්නාගෙන් එක්කෙනෙක් තමයි රනිල් වික්‍රමසිංහ. අනික් කෙනා චන්ද්‍රිකා බණ්ඩාරනායක. මේ ප්‍රශ්නය පිළිබඳ ඇයටත් නිවැරදි දැකීමක් තිබුණත් ඒ දැක්ම ක්‍රියාත්මක කළොත් තම බලය අහිමිවෙයි කියන බිය නිසා ඇය එය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේ නෑ.

තම දැක්ම සමාජය ඉදිරියේ කියන්න ගිහින් තමයි රනිල් වික්‍රමසිංහ තම බලය අහිමි කරගත්තේ. ඒ නිසා දේශපාලනික වශයෙන් ජාතික ප්‍රශ්නය කියන්නේ දෙපැත්ත කැපෙන කඩුවක් වගේ. මේ සම්බන්ධව තම අවංක අදහස ප්‍රකාශ කළොත් දකුණේ අය දකින්නේ ඒක මහ ජාතිය පාවාදීලා සිංහල-බෞද්ධාගම විනාශ කරලා රට දෙකට කඩන්න යන කුමන්ත්‍රණයක් විදිහට. ඒ විතරක් නෙමෙයි උතුරේ අය ඒක පිළිගන්නෙත් නෑ. මොකද ඔවුන් කල්පනා කරන්නේ මේක තමන්ගෙන් ඡන්දය අරන් බලයට එන්න කරන බොරු මායාවක් විතරයි කියලා.

නැත්නම් ප්‍රභාකරන් මිනිස්සුන්ට ඡන්දය දෙන්න ඉඩ නොදී රනිල් වික්‍රමසිංහව පරාජය කරන්නේ නැනෙ. හරිනම් ඔවුන් කරන්න තිබුණේ රනිල්ව ජයග්‍රහණය කරන එක. ඒ නිසා මේ ප්‍රශ්නයට අවසන් විසඳුම් දෙන්න ගියාම සමහර වෙලාවට දේශපාලනිකව අතරමංවෙන්න ඉඩ තියෙනවා. රනිල්ට ඡන්දය නොදීම කියන කරුණෙදි ප්‍රභාකරන් ඉල්ලපු දේ සහ රනිල් ලබාදීමට ගිය දේ අතර පරස්පරයකුත් තිබුණා. මොකද ප්‍රභාකරන් ඉල්ලුවේ වෙනම රාජ්‍යයක්, රනිල් දෙන්න ගියේ බලය බෙදාහැරීමක්.

වර්තමානය තුළ පවා එක්සත් ජාතික පක්ෂය සම්පූර්ණයෙන් අනාථවෙලා ඉන්නේ. ඔවුන්ට ජාතික ප්‍රශ්නයක් තියෙනවාද කියලාවත් වගක් නෑ. මොකද ඔවුන්ට තියෙන ලොකුම ප්‍රශ්නෙ නායකත්වය පිළිබඳ ප්‍රශ්නය. අනෙක් කරුණ තමයි කිසිම අවබෝධයක් නැති අය දේශපාලනයට පිවිසීම සහ ප්‍රශ්න නිරාකරණය කරන්න යෑම. මේක එක්සත් ජාතික පක්ෂයට නෙමෙයි ආණ්ඩු පක්ෂයටත් ටීඑන්ජී එකටත් පොදුයි. මොකද ඒ වගේ අය දේශපාලනයට පිවිසුණාම ඔවුන් හැම දෙයක් දිහාම බලන්නේ පටු, ආවේගකාරී සහ පොදු බවකින් තොර සිතුවිලිවලින්. මම ජනාධිපතිවරයෙක්, මම ඇමතිවරයෙක් මම මන්ත්‍රීවරයෙක් කියලා හිතුවට මේ බුද්ධිය පහළවෙන්නේ නෑ. මේවා විෂයානුබද්ධ කරුණු. ඒවා ඉගෙන ගන්න ඕනෙ. ඒවා තුළනාත්මකව අධ්‍යයනය කරන්න ඕනෙ සහ ඒවා අනෙක් රටවල් සමග සංසන්දනය කරන්න ඕනෙ. එහෙම නැතිව ඡන්දයක් දිනාගෙන ගිහින් මම මේවා දන්නවා කියලා හිතන්න බෑ.

ඇමරිකාව වගේ රටක් ලෝකයේ ලොකුම ජාතිකත්වය කියන එක ගොඩනැගුවේ සහ ලෝකයේ පොහොසත්ම සහ බලවත්ම රට බවට පත්වුණේ තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්. අපිට එහෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නෑ. අඩුවශයෙන් නිදහසින් පසු ගොඩනැගුණු කිසිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් අපේ දේශපාලන දර්ශනය මොකක්ද, ආර්ථික දර්ශනය මොකක්ද, සමාජ දර්ශනය මොකක්ද සහ ජාතිය එක්සත් කිරීම හා ජාතිය ගොඩනැගීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය මොකක්ද කියන කරුණු කාරණා නිවැරදිව ප්‍රකාශ වුණේ නෑ. එකක් නිදහස ලබාගන්න එහෙන් මෙහෙන් ගැටගහ ගත්තා. 1972දී සිරිමාවෝ බණ්ඩාරනායක තමන් නොදන්න දෙයකට අත ගහලා ඒක සම්පූර්ණයෙන් විනාශ කළා. 1978දී ජේ.ආර්. ජයවර්ධන සිංහල බෞද්ධ ජනතාව තමන්ගේ පැත්තේ තියාගෙන තනි පුද්ගල ආඥාදායකත්වයක් ගොඩනැගුවා. මේ 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අර්ථයවත් නොදන්න මිනිස්සු හදපු, මේ ලෝකයේ තියන්න වටින්නෙ නැති ව්‍යවස්ථාවක්. ■